2014 ජනවාරි 31 දින සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානවල සිටි පුද්ගලයන්ට නිකුත් කළ නිවේදනය සඳහා තොරතුරු සැපයීමේ කාලය 2018 ඔක්තෝබර් 19 දිනෙන් අවසන් විය. එසේ වුවත් කොමසාරිස්වරයා විසින් පහත කොන්දේසිවලට යටත් වන අයගෙන් තොරතුරු ලබා ගැනීම තව දුරටත් සිදු කරනු ඇත.

a. තමන් සැපයීමට බලාපොරොත්තු වන තොරතුරුවලට අදාලව, 2018 ඔක්තොබර් 19 දින හෝ ඊට පෙර ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් හෝ අයදුම්පතක් ඉදිරිපත් කර තවමත් පිළිතුරු බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයන්ට

හෝ

b . ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුවට 2018 ඔක්තොබෙර් 19 අවසන් දිනට  පෙර තොරතුරු සැපයු බවට හෝ අයදුම් පතක් ඉදිරිපත් කළ බව සනාථ  කරමින් ඒ පිළිබඳ දෙපාර්තමේන්තුවේ තීරණය 2018 සැප්තැම්බර් 18 දින හෝ පසුව ලැබුනේ නම්,

හෝ

ඉහත දැක්වූ a හෝ b හෝ කොන්දේසිවලට යටත් වන පුද්ගලයන්ට දෙපාර්තමේන්තුවේ පිළිතුරු ලැබුණු දින සිට දින 40 ක් ඇතුලත තව දුරටත් දෙපාර්තමේන්තුවට තොරතුරු සැපයීමට අවසර ලබාදී ඇත.

ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ඉහත a හෝ b කොන්දේසිවලට යටත් වන පුද්ගලයන් ව වෙන වෙනම අමතා සම්බන්ධ කර ගනු ඇත.

## ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ කාර්යාලය

## 2014 ජනවාරි 31 දින සංක්‍රමණික රැඳවුම් භාරයේ සිටි සියළු දෙනා වෙතටයි

## පසුබිම

1. 2014 පෙබරවාරි 10 දින සංක්‍රමණ හා දේශසීමා ආරක්ෂක දෙපාර්තමේන්තුව **(දෙපාර්තමේන්තුව)** එහි වෙබ් අඩවියේ වැරදීමකින් රැඳවුම් වාර්තාවක් පළ කළේ ය. 2014 ජනවාරි 31 වන විට සංක්‍රමණ රැඳවුම් ආයතනවල හෝ පදිංචි නිර්ණය යටතේ ප්‍රජාව තුළ හෝ විකල්පීය රැඳවුම් මධ්‍යස්ථානවල හෝ රඳවා සිටි පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු එම වාර්තාවේ අඩංගු විය. (**දත්ත කඩකිරීම** )

1. එම පෞද්ගලික තොරතුරු 2014 පෙබරවාරි 19 දින දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් හා 2014 පෙබරවාරි 27 දින අන්තර්ජාල ලේඛනාගාරයෙන් ඉවත් කරන ලදී.
2. මෙසේ වැරදීමකින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ තොරතුරු ඇතුලත් වූ පුද්ගලයන් වෙනුවෙන් 2015 අගෝස්තු 30 දින කොමසාරිස්වරයා වෙත නියෝජිත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. (**නියෝජිත පැමිණිල්ලක්**)

## නියෝජිත පැමිණිල්ලක් යනු කුමක්ද ?

3. 1988 පෞද්ගලිකත්ව පනත යටතේ ස්වකීය පෞද්ගලිකභාවයට බාධා කරන පනතක් හෝ ක්‍රියාවලියක් සම්බන්ධයෙන් එයට අදාල වන අනිත් පුද්ගලයන් ද වෙනුවෙන් එක් පුද්ගලයකු ඉදිරිපත් කරන පැමිණිල්ලක් නියෝජිත පැමිණිල්ලක් වේ. එම පැමිණිල්ල සලකා බලා ඒ පිරිසට සිදුවූ පාඩුව හා හානිය වෙනුවෙන් වන්දි ලැබීමට ඔවුන් සුදුසුකම් ලබන ලබන බවට කොමසාරිස්වරයා නිවේදනයක් නිකුත් කිරීමට ඉඩ තිබේ.

## මේ නිවේදනය වැදගත් වන්නේ කුමක් නිසාද ?

4. දත්ත කඩකිරීම හේතුවෙන් පෞද්ගලික තොරතුරු ප්‍රකාශයට පත් කිරීම නිසා කවර පුද්ගලයකුට හෝ සිදුවූ පාඩු හෝ හානි නිසා ඔවුන් වන්දි ලැබීමට සුදුසුකම් ලබන්නේද යන්න ඇතුළු නියෝජිත පැමිණිල්ල පිළිබඳව තීරණයක් ගැනීම සඳහා කොමසාරිස්වරයාට ඔබගේ තොරතුරු අවශ්‍ය වන්නේ ය.

5.දත්ත කඩකිරීම හේතුවෙන් ඔබට අහිතකර බලපෑමක් ඇති වුවත් ඔබ පහත දැක්වෙන ආකාරයට තොරතුරු ලබා නොදුනහොත්, දත්ත කඩකිරීම නිසා ඔබට කිසිදු පාඩුවක් හෝ හානියක් සිදුවූ බව පිළිගැනීමට කොමසාරිස්වරයා අසමත් වනු ඇත. ඒ අනුව දත්ත කඩකිරීම සම්බන්ධයෙන් ඔබට වන්දි නොලැබී යනු ඇත.

## මා කළ යුත්තේ කුමක්ද ?

1.දත්ත කඩකිරීම හේතුවෙන් ඔබට කිසිදු පාඩුවක් හෝ හානියක් සිදුවී නැත්නම් වන්දි ලැබීමට ඔබ සුදුසුකම් නොලබන අතර ඔබට මේ නිවේදනය නොසලකා හැරිය හැකිය.

2.දත්ත කඩකිරීම හේතුවෙන් ඔබට පාඩු හෝ හානි සිදු වුයේ යයි ඔබ විශ්වාස කරන්නේ නම්, එම පාඩු හෝ හානි සඳහා වන්දි ලබා ගැනීමට අවස්ථාවක් අවශ්‍ය **නම් ඔබට විඳින්නට සිදුවූ පාඩු හෝ හානි** පිළිබඳව කොමසාරිස්වරයාට තොරතුරු සැපයිය යුතුය.

1.ඔබට වූ පාඩු හෝ හානි වලට අදාල යයි ඔබ සිතන සියළු තොරතුරු ඔබ විසින් සැපයිය යුතුය.

2.එම තොරතුරු දිවුරුම් ප්‍රකාශණයක් හෝ **ඔබගේ වචන වලින්ම** ලියා අත්සන් කළ ප්‍රකාශණයක් මගින් ඉදිරිපත් කළ හැකිය. සම්මත පෝරමයක ලියන ලද දිවුරුම් ප්‍රකාශණවලට හෝ අත්සන් කළ ප්‍රකාශණවලට ලැබෙන්නේ අඩු වටිනාකමකි.

3.දත්ත කඩකිරීමේ කාලයේ පටන් හෝ දත්ත කඩකිරීම පිළිබඳව ඔබ පළමුවෙන්ම දැනගත් දිනයේ සාක්ෂ්‍ය මේ තොරතුරුවලට ඇතුලත් කළ හැකිය. නිදසුනක් ලෙස දත්ත කඩකිරීම ගැන ඔබ දැනගත් විට ඔබට ඇතිවූ හැඟීම් හා ඔබ එයට ප්‍රතිචාර දැක්වූ සැටි හෝ ඔබ ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර ඇතොත් ඒවා ඇතුලත් වෛද්‍ය වාර්තා මෙම තොරතුරු වලට ඇතුලත් විය හැකිය. මෙම නිවේදනය නිකුත් කළ දිනෙන් පසුව ලබාගත් වෛද්‍ය වාර්තාවලට අඩු වටිනාකමක් ලැබෙනු ඇත.

4. ඔබේම වචනවලින් නොලියා ඔබ වෙනුවෙන් වෙනත් අයකු විසින් ලියන ලද ලියුම් වලට ලැබෙන්නේ අඩු වටිනාකමකි.

5.යට සඳහන් අවසාන දිනයට පසුව ඉදිරිපත් කරන තොරතුරු කොමසාරිස්වරයා විසින් සැලකිල්ලට නොගැනීමට ඉඩ තිබේ.

3. ඔබ මේ තොරතුරු oaic.gov.au/repcomplaint වෙබ් අඩවියේ ඇති පිළිතුරු පෝරමයට ඇතුලත් කළ යුතුය repcomplaint@oaic.gov.au ඊ මේල් ලිපිනයට එවීමෙන් හෝ GPO Box 5218, Sydney NSW 2001 ලිපිනයට තැපැල් කිරීමෙන් හෝ ඔබගේ තොරතුරු සැපයිය හැකිය. ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයා ගේ කාර්යාලයට (OAIC) හෝ දෙපාර්තමේන්තුවට ඔබව හඳුනාගැනීම සඳහා ඔබගේ සම්පූර්ණ නම, උපන් දිනය, සංක්‍රමණ දෙපාර්තමේන්තුවේ ඔබට අදාල අංකයක් ඇතොත් ඒ අංකය ඇතුළු ප්‍රමාණවත් තොරතුරු සැපයිය යුතුය.

4. මේ ඕනෑම තොරතුරක් **2018 අප්‍රේල් 19** දින ප.ව. **4.00** ට පෙර එවිය යුතුය.

## නියෝජිත පැමිණිල්ලට සහභාගී නොවීම

5.නියෝජිත පැමිණිල්ල ඔබ වෙනුවෙන් ද ඉදිරිපත් කිරීමට ඔබ කැමැත්ත පළ නොකරන්නේ නම් හෝ එයට සම්බන්ධ වීමට අකමැති නම් ඕනෑම වේලාවක OAIC වෙබ් අඩවියට පිවිස තොරතුරු පෝරමය පිරවීමෙන් ඔබට නියෝජිත පැමිණිල්ලෙන් ඉවත් විය හැකිය.

6. පැමිණිල්ලට සම්බන්ධ නොවීම නිසා දත්ත කඩකිරීම සම්බන්ධයෙන් ඔබට වන්දි ලබා ගැනීමේ අවස්ථාව මග හැරී යනු ඇත.

කරුණාකර පිළිතුරු පෝරමයේ ඇති විස්තර අවධානයෙන් යුතුව කියවන්න.

## ප්‍රශ්න හා උපකාර

1.මේ නිවේදනය තේරුම් ගැනීමට හෝ එයට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් ඔබට සහාය අවශ්‍ය වන්නේ නම් කරුණාකර 1300 363 992 අංකයට හෝ OAIC කාර්යාලය අමතන්න. නැත්නම් repcomplaint@oaic.gov.au. විද්‍යුත් ලිපිනයට ඊමේලයක් යවන්න.

2014 ජනවාරි 31 දින සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානවල සිටි පුද්ගලයන්ට නිකුත් කළ නිවේදනය සඳහා ප්‍රතිචාර දක්වමින් තොරතුරු දැනුම්දීමේ කාලය නියෝජ්‍ය කොමසරිස්වරයා විසින් තවත් සති 14 කින් දීර්ඝ කර ඇත. මේ අනුව තොරතුරු සැපයීමේ කාල සීමාව 2018 ඔක්තෝ බර්  19 දින සවස 4.00 ට අවසන් වෙයි. තව දුරටත් මේ කාල සීමාව දීර්ඝ කිරීමක් සිදු කරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි ය.